(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 62.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 දෙසැම්බර් මස 08 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0233/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0472/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට "හෙජින්" ගනුදෙනු ක්‍රමය හඳුන්වාදුන්නේ කවරෙක්ද;

(ii) එම ගනුදෙනුව ඉදිරිපත් කිරීමේ අරමුණ කුමක්ද;

(iii) ඒ සඳහා කිසියම් ටෙන්ඩර් කැඳවීමක් කරන ලද්දේද;

(iv) ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද අයගේ නම් කවරේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා, හෙජින් ගනුදෙනු සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) මෙම ගනුදෙනුවට විරුද්ධව මහජනයා විසින් පවරන ලද නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එවැනි නඩු පැවරූ අයගේ නම් සහ එම නඩු පැවරූ දිනයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රතිඵලය කවරක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අභ්‍යන්තර සමථකරණයක් සඳහා කිසියම් බැංකුවක් විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තෝරාගෙන තිබේද;

(ii) එසේ තෝරාගෙන තිබේ නම්, ඒ කොපමණ මුදලකටද සහ එය සිදුකළ ස්ථානය කවරේද;

(iii) සිදු කරන ලද නීතිමය කටයුතු වෙනුවෙන් මේ දක්වා ගෙවීමට තිබෙන මුළු මුදල කොපමණද;

(iv) නීතිමය කටයුතු සඳහා වියදම් ලෙස ගෙවීමට නියමිත මුදල කොපමණද;

(v) ඉහත නඩු සඳහා සම්භාව්‍ය වගකීම් වටිනාකම කොපමණද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0715/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මගනැගුම යන්ත්‍රෝපකරණ හා ඉදිකිරීම් සමාගමේ සභාපතිවරයා පත් කළ බලධාරියා කවුරුන්ද;

(ii) එම සභාපතිවරයාගේ වයස කොපමණද;

(iii) ඔහු මෙයට පෙර සේවය කළ ස්ථානය හා තනතුර කවරේද;

(iv) ඔහුගේ වෘත්තීය පලපුරුද්ද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0836/'10

4.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන වැඩසටහන යටතේ අති සාර්ථක වී මිලදී ගැනීමේ ක්‍රමයක් ඇතිවී තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ වුවත් නාත්තන්ඩිය ප්‍රදේශයේ වී මිලදී ගැනීමේ වැඩපිළිවෙල වී ගබඩා පහසුකම් නොමැතිවීම හේතුකොටගෙන අසාර්ථක වී ඇති බවත්;

(ii) එම ප්‍රදේශය තුළ පිහිටි වී ගබඩා කිරීමට ඉතාමත් යෝග්‍ය ස්ථානයක් වූ වයඹ (පේෂකර්ම) සමූපකාර ව්‍යාපාරයට අයත් දැවැන්ත ගොඩනැගිල්ලක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන වර්ෂ ගණනාවක් තිස්සේ වසා තබා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) අදාළ සමූපකාර ප්‍රධානීන් සමඟ සාකච්ඡා කොට මෙම ගොඩනැගිල්ල ප්‍රදේශයේ ගොවි ජනතාවගේ වී ගබඩා කිරීම සඳහා යොදා ගැනීමට හා රජයට පවරා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0234/'10

5\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වලස්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0577/'10

6\.

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවාවට අවශ්‍යවන හෙදියන් සංඛ්‍යාව කවරේද;

(ii) දැනට සේවයේ නියුතු හෙදියන් සංඛ්‍යාව කවරේද;

(iii) හෙදියකගේ වැටුප සහ ඔවුන්ට ලැබෙන අමතර ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ හෙද අභ්‍යාස විද්‍යාල පිහිටා ඇති ස්ථාන කවරේද;

(ii) වසරකට පුහුණු කරනු ලබන හෙදියන් සංඛ්‍යාව කවරේද;

(iii) එක් හෙදියක් පුහුණු කිරීම වෙනුවෙන් වසරකට වැයවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රම සඵලතාව සඳහා යොදා ගතහැකි අයුරින් මෙම ප්‍රමාණයට වඩා වැඩියෙන් හෙදියන් පුහුණු කිරීමට හැකියාවක් නොතිබේද යන්න වැඩිදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0718/'10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට මේ දක්වා ආනයනය කරන ලද මුළු කුකුල් මස් ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් මාසය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කුකුල් මස් ආනයනය කරන ලැබූ රටවල් කවරේද;

(iv) කුකුල් මස් කිලෝවක් ආනයනය සඳහා වැය වූ මුදල කොපමණද;

(v) ආනයනික මස් අලෙවි කිරීම සඳහා ලබා දුන් ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0837/'10

8.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අසාරවත් වැලිබිම් තීරුව මත රසායනික පොහොර සහ පළිබෝධ නාශක වර්ග යොදමින් එළවළු සහ පළතුරු වගා කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අසාරවත් බිමට යොදන යූරියා ඇතුළු රසායනික පොහොර වර්ගයන්හි ඇති නයිට්‍රේට් සහ නයිට්‍රයිට් යන විෂ රසායනික එම ප්‍රදේශවල භූගත ජලයට එකතු වී එම ජලය දැඩි ලෙස අපවිත්‍ර වී ඇති බවත්;

(ii) වෛද්‍ය විශේෂඥයින්ගේ මතය අනුව එම අපවිත්‍ර ජලය භාවිත කරන ජනතාව රෝගීන් වන බවත්;

(iii) එම නිසා කල්පිටිය ප්‍රදේශයේ ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කිරීම කඩිනම් කළයුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එවැනි වැඩ පිළිවෙළක් කඩිනමින් සැකසීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා.9.30 සිට අ.භා.7.30 දක්වා විය යුතුය. අ.භා.7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2011) — (දහහතරවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 07 වැනි දින ප්‍රගතිය)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2010 නොවැම්බර් මස 29 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*3.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*4.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන, ජනාවාස හා රණවිරු සුභසාධන අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (ලියාපදිංචි කිරීමේ)" නියෝගයෙහි 2(2) වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2010 අප්‍රේල් මස 12 වැනි දින අංක 1649/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.11.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*6.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*8.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*9.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*10.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*11.

පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*12.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

13.

පින සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

14.

ශ්‍රී ලංකාවේ සැමට සෙත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

15.

මහේෂ්වරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2011) නැමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.